# රේගු නිවේදනයයි

## ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 06/2018

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2018 ජූලි මස ...10.......වැනි දින
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේදීය.

# 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

## ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, 2018 ජුලි මස .......11.......... වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මංගල සමරවීර<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජුලි මස .......10.......... වන දින<br>
කොළඹ 01,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| 22.02 | | | සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළාවූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග. | | | |
| | | | | | | |
| | 2202.99 | -- | අනෙකුත්: | | | |
| | 2202.99.10 | --- | තේ පානයක් ලෙස | | 30% | ලීටර් |
| | 2202.99.20 | --- | ඖෂධ ලෙසට ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අනුමත කළ පාන වර්ග | | 30% | ලීටර් |
| | 2202.99.30 | --- | "ශක්ති ජනක පාන " ලෙස අලෙවි වන පාන වර්ග | | 30% | ලීටර් |
| | 2202.99.40 | --- | ශාක සාර පාදක කරගත් පානයන් | | 30% | ලීටර් |
| | | --- | පළතුරු හෝ එළවළු යුෂ පාදක කරගත් පානයන් : | | | |
| | 2202.99.51 | ---- | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.59 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| | | --- | කිරි පාදක කරගත් පානයන් | | | |
| | 2202.99.61 | ---- | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.69 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| | 2202.99.70 | --- | ධාන්‍ය හෝ ගස්වල හට ගන්නා කට්ට සහිත ගෙඩි, ඇට පාදක කරගත් පානයන් | | 30% | ලීටර් |
| | | --- | අනෙකුත්: | | 30% | ලීටර් |
| | 2202.99.91 | ---- | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | | 30% | ලීටර් |
| | 2202.99.99 | ---- | අනෙකුත් | | 30% | ලීටර් |
| 14.04 | 1404.90.10 | --- | බීඩි කොළ | | 30% හෝ කි. ග්‍රෑමයට රු.250/- | කි.ග්‍රෑ. |